# ශ්‍රී ලංකාවේ ඌව පළාතේ තවලම් ප්‍රවාහණ මාධ්‍යය පිළිබඳ ජනශ්‍රැතික අධ්‍යයනයක්

ඩබ්. ජී. ඩී. එන්. ලක්මාලි[1]

"තවලම" යනු කඳු හෙල් වන ළැහැබ් සහිත දුෂ්කර ප්‍රදේශ හරහා භාණ්ඩ ප්‍රවාහණය කිරීමේ දී ගවයා උපයෝගී කරගනිමින් සකස් කරගන්නා ලද ප්‍රවාහණ මාධ්‍යයකි. පොට්ටනි, කද ආදියෙන් පසු භාණ්ඩ ප්‍රවාහණය කිරීමේ ප්‍රාථමික අවස්ථාව වූයේ තවලම යි. අනුරාධපුර යුගයේ පටන් භාණ්ඩ ප්‍රවාහණය උදෙසා විවිධ ප්‍රවාහණ මාධ්‍ය මෙරට ක්‍රියාත්මක වුවත් ඌව පළාතේ බහුල ම හා ජනප්‍රිය ම ප්‍රවාහණ මාධ්‍යය වූයේ තවලම යි. එසේ වීමට බලපෑ සුවිශේෂ හේතුවක් තිබිය යුතු ය. ඇතැම් ගවේෂකයන්ගේ වාර්තා අනුව පැහැදිලි වන්නේ ඌවේ පවතින භූ විෂමතාව හා මාර්ග දුෂ්කරතාව නිසා තවලම ජනප්‍රිය ප්‍රවාහණ මාධ්‍යය වූ බව යි. ගවයා සම්බන්ධ ජනශ්‍රැති අංග පිළිබඳ විද්වතුන් රැසකගේ අවධානය යොමු වුවත්, පැරණි භාණ්ඩ ප්‍රවාහණ මාධ්‍යයක් වූ තවලම සම්බන්ධයෙන් පුළුල් පර්යේෂණයක් මෙතෙක් සිදු වී නොමැත. ලංකාවේ කඳුකර ප්‍රදේශ රැසක ප්‍රවාහණ මාධ්‍යය වශයෙන් තවලම අදටත් ජනප්‍රිය ව පැවතියත් මේ අධ්‍යයනයෙහි සීමා දක්වනු පිණිස ඌව පළාතේ තවලම් භාවිතය පිළිබඳ ව මෙහි දී අවධානය යොමු වෙයි. ඒ සඳහා ඌව පළාතේ දැනට තවලම් භාවිත කරන ප්‍රදේශ කරා ගොස් තවලම්කරුවන් හමු වී සිදු කරන සම්මුඛ සාකච්ඡා හා ප්‍රශ්නාවලි මඟින් කරුණු එක් රැස් කිරීමත් ඉතිහාසය, සාහිත්‍යය, ජනශ්‍රැතිය ආදි ක්ෂේත්‍ර අලළා ලියැවුණු කෘති අධ්‍යයනය කිරීමත්, අන්තර්ජාලය භාවිතයත් මඟින් දත්ත ගවේෂණය කෙරිණි. දිගු ඉතිහාසයකට උරුමකම් කියන තවලමට ආවේණික ව පවතින සංස්කෘතියත්, තවලම මඟින් ජනශ්‍රැතියට එක් වුණු ජන කවි, ජන කතා ආදියත් තවලම් ඉතිහාසය හා එයින් ලත් ප්‍රයෝජනත් මේ පර්යේෂණයෙන් හෙළි කෙරේ.

**ප්‍රමුඛ පදඃ** ඌව පළාත, භාණ්ඩ ප්‍රවාහණය, භූ විෂමතාව, මාර්ග දුෂ්කරතා, තවලම

---

[1] සිංහල අධ්‍යයනාංශය